**පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් අරමුදල - 2020**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් අරමුදලේ 2020 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත, 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව පලාත් පාලන සේවා ආඥා පනතේ (264 අධිකාරියේ) 62 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අරමුදලේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදල අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ප්‍රමිත අංක 01 ක ප්‍රකාරව අරමුදල විසින් උපචිත පදනම මත ගිණුම් තැබිය යුතු වුවද, ආදායම් හා වියදම් ගිණුමේ සමාලෝචිත වර්ෂය සඳහා ලැබිය යුතු දායක මුදල රු. 72,558,585 ක් උපචිත පදනම මත නියමිත පරිදි බැර කර තිබුණද වර්ෂය තුලදී ලැබී තිබුණු පූර්ව වර්ෂවලට හා මෙම වර්ෂයට අදාළ දායක මුදල් රු. 75,230,921 ක් එම ගිණුමට හර කර තිබුණි. මේ අනුව ඇතිවූ වෙනස රු. 2,672,336 ක් වර්ෂයේ ඌනතාවය ලෙස හඳුනාගෙන තිබුණි. | පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් ලබන ප්‍රතිලාභීන් සඳහා මාසික විශ්‍රාම වැටුප් ගෙවීම 2011 වර්ෂයේ සිට මෙම අරමුදල උපයෝගී කොට ගෙන සිදු නොකෙරෙන බැවින් විශ්‍රාම වැටුප් ගෙවීම උපචිත පදනම අනුව ගැළපීම් නොකෙරේ | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 ප්‍රකාරව ආදායම් වියදම් උපචිත පදනම මත ගිණුම් ගත කළ යුතු වීම. |

### 1.5.2 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මූල්‍ය ප්‍රකාශ අනුව 2020 දෙසැම්බර් 31 දිනට අරමුදලට දායක මුදල් ගෙවනු ලබන පළාත් පාලන ආයතන සංඛ්‍යාව 302 ක් වූ අතර එම ආයතනවලින් අයකර ගත යුතු හිඟ දායක මුදල රු.1,143,420,252 ක් විය. එසේ වුවද , 2020 දෙසැම්බර් 31 දිනට පළාත් පාලන ආයතන 256 කින් විගණනයට ඉදිරිපත් කර තිබූ මූල්‍ය ප්‍රකාශ අනුව , පළාත් පාලන ආයතන 97 කින් | එක් එක් පළාත් පාලන ආයතන මඟින් මාසිකව එවනු ලබන චෙක්පත් වල අගයන් අඩු කර පළාත් පාලන ආයතන වෙත මාසිකව බිල්පතක් යැවීම මඟින් එම ආයතන ගෙවීමට ඇති මුදල් පිළිබඳ දැනුම් දීමක් සිදු කරනු ලැබේ. තවද ඒ ඒ | ලැබිය යුතු දායක මුදල් අයකර ගැනීමට පියවර ගත යුතු අතර වෙනසට හේතු හඳුනා ගෙන නිවැරදි කිරීමට |

| | | |
|---|---|---|
| අරමුදලට ලැබිය යුතු දායක මුදල් රු. 760,406,356 ක් වුවද, එම වටිනාකම පළාත් පාලන ආයතනවල ගෙවිය යුතු දායක මුදල් ලෙස දක්වා නොතිබුණි. තවත් පළාත් පාලන ආයතන 103 කින් අරමුදලට ලැබිය යුතු දායක මුදල් වටිනාකම රු. 278,494,348 වුවත් එම පළාත් පාලන ආයතනවල මූල්‍ය ප්‍රකාශන අනුව ගෙවිය යුතු දායක මුදල් වටිනාකම රු.184,054,767 ක් වූයෙන් රු.94,439,581 ක් වැඩියෙන්ද, පළාත් පාලන ආයතන 22 කින් අරමුදලට ලැබිය යුතු දායක මුදල් වටිනාකම රු. 14,868,309 ක් වුවත් එම පළාත් පාලන ආයතන වල මූල්‍ය ප්‍රකාශන අනුව ගෙවිය යුතු දායක මුදල් වටිනාකම රු. 19,567,394 ක් වූයෙන් රු. 4,699,085 ක් අඩුවෙන් ද දක්වා තිබුණි. | පළාත් පාලන ආයතන වලින් ලැබෙන දායක මුදල් සඳහා මාසිකව නිකුත් කරන ලදු පත්‍ද එම බිල් පත සමඟ එම ආයතන වෙත යවනු ලැබේ. මේ අනුව අඛණ්ඩව ඉදිරියට රැගෙන යන බිල් පොත්හි 2020.12.31 ශේෂය හා අවසාන ගිණුම්හි 2020.12.31 ආයතන වලින් ලැබිය යුතු දායක මුදල් ශේෂය අතර වෙනසක් නොමැත. ඔබ විසින් පෙන්වා දී ඇති වෙනස්කම් සම්බන්ධයෙන් එම ආයතන වලින් විමසීම් සිදු කර වෙනසක් පවතීනම් නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. | කටයුතු කළ යුතු වීම. |

**1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරණු ලැබේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2018 අගෝස්තු 28 දිනැති හා අංක 2/2018 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 5 ඡේදය සහ 2020 අගෝස්තු 28 දිනැති අංක 1/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 15 (2) (ආ) ඡේදය | පසුගිය වසර 2 තුල ක්‍රියාත්මක නොවුනු යම් අරමුදල් පවතින්නේ නම් එකී අරමුදල්වල කටයුතු අවසන් කල යුතු බව හා අරමුදල් මගින් අපේක්ෂිත අරමුණු රජයේ අයවැය යටතේ ඉටුකර ගත හැකි නම් එකී අරමුදල්වල කටයුතු අවසන් කල යුතු බවද දක්වා තිබුණි. ඒ අනුව මෙම අරමුදලේ කටයුතු විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු වැය ශීර්ෂය යටතේ අයවැය ප්‍රතිපාදන සලසාගෙන සිදු කරන බැවින් හා අරමුදල අක්‍රිය තත්වයේ පවතින බව ගිණුම් සටහන් අංක 4 මගින් හෙලිදරව් කර ඇතත් පවතින චක්‍රලේඛ ප්‍රතිපාදන යටතේ අරමුදල වසා දැමීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි. | මහා භාණ්ඩාගාරය විසින් පත් කරනු ලැබූ විශේෂ කමිටුවේ 2017 මාර්තු 31 දිනෙන් නිකුත් කරන ලද කමිටු වාර්තාවට අනුව පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් අරමුදල ඇතුළු අරමුදල් පාර්ලිමේන්තු පනතක් මගින් වසා දැමිය යුතු බවට නිර්දේශ කර ඇත. එසේ වුවත් එකී වාර්තාව සම්බන්ධයෙන් යම් ප්‍රතිපත්ති තීරණයක් ගෙන ක්‍රියාත්මක කිරීම සඳහා බලය ලබා දීමක් පිළිබඳව මෙතෙක් වාර්තා වී නැත | චක්‍ර ලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | 2012 පෙබරවාරි 08 දිනැති හා අංක 01/2012 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛය | ඒ ඒ මාසයේ අරමුදලට අදාල සාමාජිකයන්ගේ මියයෑම් පිළිබඳ වාර්තා ඊළඟ මාසයේ 25 දිනට පෙර දිස්ත්‍රික් ලේකම්වරුන්ගෙන් ගෙන්වාගෙන එම වාර්තා අනුව කාලීනව මියයෑම් ගැලපීමට පියවර ගත යුතුය. එසේ වුවද වාර්ෂිකව එම ගැලපීම සිදු නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදී 2014 වර්ෂයේ සිට 2020 වර්ෂය අතර කාලයේදී මියගිය සාමාජිකයන් 647 කට අදාලව රු 2,306,611 ක් ලැබිය යුතු දායක කපා හැර තිබුණි. | මගේ අංක ප.පා.ගි 3/2/7 හා 2019/02/28 දිනැති ලිපි මඟින් සියලුම පළාත් පාලන ආයතන වල ලේකම්වරු වෙත සාමාජිකයින්ගේ මියයෑම් පිළිබඳ දැනුම් දෙන ලෙස දන්වා යවා ඇත. පරිගණක දත්ත පද්ධතිය හරහා මිය ගිය විශ්‍රාමිකයින් පිළිබඳව තොරතුරු ලබා ගැනීමට හැකිවීම හා පළාත් පාලන ආයතන වලින් මිය ගිය විශ්‍රාමිකයින් පිළිබඳව මාසිකව ලද තොරතුරු පදනම්ව මිය යෑම් ගළපා ගැනීමට පසුගිය වර්ෂ කිහිපය තුළ හැකියාව ලැබිණි.<br>මෙම තොරතුරු ක්‍රමවත්ව සිදු නොවූ කාල වල මිය ගිය විශ්‍රාමිකයින්ගේ තොරතුරු විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත එවන ලෙස අදාල පළාත් පාලන ආයතන වෙත නාම ලේඛන සමඟ දත්ත පද්ධතියෙන් ලබා ගත හැකි තොරතුරු ලබා දීමට කටයුතු කරමින් පවතී. | චක්‍ර ලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

.

## 2. මූල්‍ය සමාලෝචනය

---------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

-------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා අරමුදලේ මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵලය රු. 2,672,336 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 132,436,333 ක් වූයෙන් ඉකුත් වර්ෂය හා සැසඳීමේ දී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු. 129,763,997 ක වර්ධනයක් පෙන්නුම් කෙරිණි. ප්‍රවර්තන වර්ෂයට අදාල දායක මුදල් ආදායම් ලෙසත්, ප්‍රවර්තන වර්ෂයේදී පෙර වර්ෂවලට අදාල සහ ප්‍රවර්තන වර්ෂයට අදාල මුදල විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්ගේ පොදු ගිණුමට මාරු කිරීම් වියදම් ලෙසත් ආදායම් වියදම් ගිණුමෙහි දක්වා තිබුණි. ප්‍රවර්තන වර්ෂයේදී, දායක මුදල් ආදායම් රු. 3,890,304 ක් සහ වියදම් රු. 133,654,300 ක් ඉකුත් වර්ෂයට වඩා අඩුවීම මෙම වර්ධනයට හේතු වී තිබුණි.

## 2.2 කළමණාකරණ අකාර්යක්ෂමතා

---

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනය අනුව පළාත් පාලන ආයතන 302 කින් ලැබිය යුතු දායක මුදල් රු. 1,143,420,252 ක් විය. එම ශේෂය සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනය සමඟ ඉදිරිපත් කර තිබූ උපලේඛන අනුව පළාත් පාලන ආයතන 88 කින් ලැබිය යුතු රු. 459,007,662 ක දායක මුදල් සම්බන්ධයෙන් වූ කිසිදු මුදලක් සමාලෝචිත වර්ෂයේදී ලැබී නොතිබුණි | පළාත් පාලන ආයතන මඟින් ගෙවිය යුතු දායක මුදල් අය කර ගැනීමට මේ වන විටත් ක්‍රියා මාර්ග ගෙන ඇත. ඒ අනුව පළාත් පාලන සේවා පළාත් පාලන ආයතන ප්‍රධානීන් දැනුවත් කරන මෙන් ඉල්ලා මුදල් කොමිෂන් සභා ලේකම් වෙත ඉල්ලීමක් කර ඇත. 2019 දෙසැම්බර් මස විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේදී, බස්නාහිර පළාත් පාලන කොමසාරිස් හා විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්ගේ ප්‍රධානත්වයෙන් පළාත් පාලන ආයතන නිලධාරින් සම්බන්ධ කොට ගෙන පැවැත් වූ සාකච්ඡාවේදී මුදල් නොගෙවීම සම්බන්ධයෙන් නිලධාරින් දැනුවත් කරන ලදී. එමෙන්ම සියලුම පළාත් පාලන ආයතන වෙත යැවෙන මාසික බිල්පත් මඟින් ද ගෙවීමට ඇති මුදල් පිළිබඳ දැනුම් දීමක් සිදු කරන අතර දුරකතන ඇමතුම් ලබා දීම මඟින් ලිපි මගින් ආයතන දැනුවත් කර මුදල් ගෙන්වා ගැනීමට කටයුතු කර ඇත. | මාසිකව දායක මුදල් අයකරන බවට සුපරීක්ෂණය කල යුතු අතර හිඟ හිටි විශ්‍රාම වැටුප් දායක මුදල් නොපමාව අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. |